# 4 ශ්‍රේණිය සිංහල වැඩපොත-2020

## (3 වන වාරයට නියමිත ගුරු අත්පොතේ සඳහන් සියලු ව්‍යාකරණ කොටස් අන්තර්ගතය)



සැකසුම - හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

{W⑩ නිපුණතාව (සම්මත භාෂා ව්‍යවහාරය සහ භාෂා අභ්‍යාස සඳහා ලියයි.) සම්පූර්ණයෙන් ආවරණය කර ඇත.}

# පටුන

01) නාම පද.

02) ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී නාම පද.

03) පුරුෂ ලිංග නාම පද සහ ස්ත්‍රී ලිංග නාම පද.

04) ඒකවචන නාම පද සහ බහුවචන නාම පද.

05) අප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම.

06) ප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම.

07) "ඈ/ඇය, ඔහු, ඌ" නාම පද උක්තය ලෙස යෙදුණු වර්තමාන කාල වාක්‍ය ලිවීම.

08) "ඔවුහු" යෙදුණු වර්තමාන කාල වාක්‍ය ලිවීම.

09) "මම, අපි" සමඟ ක්‍රියාපදයේ භාවිතය - වර්තමාන කාලය.

10) ස්ත්‍රීලිංග ඒකවචන නාම පද හා පුරුෂලිංග ඒකවචන නාම පද සහිත අතීත කාල වාක්‍ය.

11) ස්ත්‍රීලිංග බහුවචන නාම පද හා පුරුෂලිංග බහුවචන නාම පද සහිත අතීත කාල වාක්‍ය.

12) "ඈ/ඇය" යෙදුණු අතීත කාල වාක්‍ය.

13) "ඔහු" යෙදුණු අතීත කාල වාක්‍ය.

14) "ඌ" යෙදුණු අතීත කාල වාක්‍ය.

15) "ඔවුහු" යෙදුණු අතීත කාල වාක්‍ය.

16) "මම" යෙදුණු අතීත කාල වාක්‍ය.

17) "අපි" යෙදුණු අතීත කාල වාක්‍ය.

18) අක්ෂර වින්‍යාසය ("ර"අකුරට පසුව "ණ" යෙදීම).

19) අක්ෂර වින්‍යාසය ("ග, ද, ඹ" සඤ්ඤක අකුරුවලට පෙර මූර්ධජ "ළ" යෙදීම).

20) අක්ෂර වින්‍යාසය (දන්තජ "ස" අකුරට පසු ව "න" යෙදීම).

21) අක්ෂර වින්‍යාසය (තාලුජ "ශ" අකුරට පසු ව "න" යෙදීම).

22) අක්ෂර වින්‍යාසය (මූර්ධජ "ෂ" අකුරට පසු ව මූර්ධජ "ණ" යෙදීම).

23) අක්ෂර වින්‍යාසය (දන්තජ "ල" හල් ව යෙදීම).

24) අක්ෂර වින්‍යාසය (අතීත කාල ක්‍රියාපදවල යෙදෙන මූර්ධජ "ණ").

25) අක්ෂර වින්‍යාසය (මූර්ධජ "ණ" අකුරෙන් ආරම්භ වන වචන).

26) අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර හඳුන්වා දීම.

27) අක්ෂර වින්‍යාසය (මිශ්‍ර අභ්‍යාස).

## 01) නාම පද

1) පහත සඳහන් පද සුදුසු තීරයේ ලියන්න.

(මාලනී, ඔරලෝසුව, විදුහල්පති, පෙනේරය, හෝමාගම, අව්ච්චියා, කොට්ටය, දුම්රිය පොළ, පාලිකාව, ගෙදර, සිරිමල්, පොත, පාසල, ඉත්තෑවා, වෛද්‍යවරයා, ගොළුබෙල්ලා, වඳුරා, වෙළඳපොළ, පළඟැටියා, මල් පෝච්චිය)

| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
|---|---|---|---|
| | | | |

2) ඡේදය කියවා වගුව පුරවන්න.

### අපේ ගෙදර

කුකුළාගේ කුක්කු කූ හඬත් කපුටන්ගේ කාක් කාක් නාදයත් හැම පැත්තෙන් ම ඇසෙයි. හණිකට අවදි වන අම්මා කුස්සියට යයි. වතුර කේතලය උණු වන්නට තබා ගෙදර සැම දෙනාට ම තේ සාදයි. මාත් නංගීත් නිදා සිටින කාමරය වෙතට එන අම්මා අප අවදි කරවයි.

උදෑසන ආහාරය පිළියෙල කරන අම්මාට අත්තම්මාගේ උදවුව ද ලැබෙයි. මුහුණකට සෝදා පාසල වෙත යාමට අප සූදානම් වන්නේ තාත්තාගේ උදවු ඇතිව ය.

උදෑසන ම මිදුලට යන අත්තම්මා මිදුල අතුගායි. මල් පැළවලට වතුර දමයි. බට්ටිච්චන්ගේ කිචි බිචි නාදයත්, ලේනුන්ගේ ටිං ටිං නාදයත් නිසා බල්ලාත් පූසාත් ඒ මේ අත දුවති.

පෙ.ව.6.30 පමණ වන විට අප තාත්තා සමඟ බස් නැවතුම වෙත යා යුතුය. අත්තම්මාට ද අම්මාට හා තාත්තාට වැඳ අපි පොත් බෑගය ගෙන නිවසින් පිටත් වුණෙමු. අප දෙදෙනා පාසල වෙත යවා තාත්තා කොළඹ වැඩපළට යාම සඳහා ඊළඟ බසයට ගොඩ වෙයි.

උදේ කාලයේ ආලින්දයේ පුටුවට වී අත්තම්මා බලා සිටින්නේ ඕස්ට්‍රේලියාවේ සිටින නැන්දාගෙන් ලියුමක් බලාපොරොත්තුවෙනි. ලියුම් මාමාගේ බයිසිකලයේ ට්‍රිං ට්‍රිං නාදය ඇසෙත් ම අත්තම්මා ගේට්ටුව ළඟට යයි.

අම්මා අප එන තුරු ගෙදර දොර වැඩ කටයුතු අවසන් කර පත්තරය බලයි. පාසල නිම වී ගෙදර එන අපි දහවල් කෑම ගෙන ආලින්දයේ සිට අත්තම්මාගෙන් කතන්දරයක් අසා ගන්නෙමු.

| නාම පද | | | |
|---|---|---|---|
| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
| | | | |

3) වගුව සම්පූර්ණ කරන්න.

| නාම පදය | පුද්ගල නාම | සත්ත්ව නාම | ද්‍රව්‍ය නාම | ස්ථාන නාම |
|---|---|---|---|---|
| ගේ කුරුල්ලා | x | √ | X | x |
| රියදුරා | | | | |
| පොත | | | | |
| පාසල | | | | |
| ගොපල්ලා | | | | |
| මහරගම | | | | |
| ගිරවා | | | | |
| පැන | | | | |
| ගැහැනිය | | | | |
| ගස | | | | |
| ගඟ | | | | |
| පුස්තකාලය | | | | |
| කුරුල්ලා | | | | |
| ලේඛිකාව | | | | |
| පොලිසිය | | | | |
| අත් පිස්නාව | | | | |

4) කියවීම් පොතේ තෝරාගත් පාඩම්වලින් නාම පද වර්ග තෝරා ලියන්න.

| නාම පද | | | |
|---|---|---|---|
| ද්‍රව්‍ය නාම | පුද්ගල නාම | ස්ථාන නාම | සත්ත්ව නාම |
| | | | |

5) පුද්ගල නාම, ද්‍රව්‍ය නාම, සත්ත්ව නාම, ස්ථාන නම යන නාම පදවලින් එක් එක් වචනය බැගින් ගෙන වාක්‍ය 10ක් ලියන්න.

1.......................................................................................................................

2.......................................................................................................................

3.......................................................................................................................

4.......................................................................................................................

5.......................................................................................................................

6.......................................................................................................................

7.......................................................................................................................

8.......................................................................................................................

9.......................................................................................................................

10.....................................................................................................................

## 02) ප්‍රාණවාචී සහ අප්‍රාණවාචී නාම පද

1) ඡේදය කියවා ප්‍රාණවාචී නාම පද සහ අප්‍රාණවාචී නාම පද වෙන් කර ලියන්න.

> අපි අගෝස්තු නිවාඩුවට යාල වනෝද්‍යානයට ගියෙමු. ඒ ගමනට මාත්, අම්මාත්, තාත්තාත් සහභාගි වූ අතර, ලොකු අම්මාත්, මහප්පාත් කාව්‍යා අක්කා සහ මිහිර මල්ලීත් සහභාගි වූහ.
>
> අපි උදේ 9.00ට පමණ කැබ් රථයකින් යාල වනෝද්‍යානයට ඇතුළු වුණෙමු. පිල් විදහා ගෙන නටන මොනරෙකු දුටු විට මිහිර මල්ලී සතුටින් කෑගැසුවේය. පුතාලා කෑගැසුවොත් සත්තු බලන්න බැරි වේවි. ඒ නිසා නිහඬ ව ගමන යා යුතු බව අපට සහය වීමට පැමිණි වනෝද්‍යානය භාර ව සිටින මාමා පැවසුවේ ය.
>
> ටික දුරක් යන විට අපි ලස්සන මුව රංචුවක් දුටුවෙමු. ගෝනා, අලියා, කොටියා, වලහා වැනි සිවුපාවුන් ද, කහකුරුල්ලා, කෑදැත්තා වැනි කුරුලු විශේෂ ද අපට දැකගත හැකි විය. දුර සිටින සතුන් බලා ගැනීමට අපි දුරදක්නයක් භාවිත කළෙමු.
>
> අපි තේ බොන විට අම්මා සාදා ගෙන ගිය හැළප හා සව් දොදොල්වල රස බැලුවෙමු. දහවල් බත් මුල් කෙසෙල් කොළවල ඔතාගෙන ගිය නිසා කෑමවල රසය වැඩි බවක් හැඟුණි.

| ප්‍රාණවාචී නාම පද | අප්‍රාණවාචී නාම පද |
| --- | --- |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |
| …………………………… | ………………………………… |

----

02) පහත සඳහන් ප්‍රාණවාචී නාම පද සහ අප්‍රාණවාචී නාම පද යොදා වාක්‍ය සකස් කරන්න.

1. කුරුලු පැටවු - ……………………………………………………………………
2. ජම්බු ගස - ………………………………………………………………………
3. සමනලයෝ - ……………………………………………………………………
4. මල් පැණි - ………………………………………………………………………
5. පේර -………………………………………………………………………………

03) කවිය කියවා  නාම පදය, ප්‍රාණවාචී නාම පදයක්/අප්‍රාණවාචී නාම පදයක් නම් ඊට ඉදිරියෙන් "√" ලකුණ යොදන්න.

බටිති මලිති - කුරුලු පැටවු
සැම තැන - ඉගිළී
ජම්බු ගසේ - ඉදුණු ජම්බු
සොය සොයා - කතී

ලේන් පැටවු - ටිං ටිං ගා
එහෙ මෙහෙ - දුවතී
පේර ගසේ - ඉදුණු පේර
රස දැයි - බලතී

සමනලයෝ - රැන් රැන්
අත්තටු - සලතී
රෝස ගසේ - මල් පැණි බී
සිරිපා - වඳිතී

| නාම පදය | ප්‍රාණවාචී | අප්‍රාණවාචී |
|---|---|---|
| කුරුලු පැටවු | | |
| ජම්බු | | |
| ලේන් පැටවු | | |
| පේර | | |
| සමනලයෝ | | |
| මල් පැණි | | |
| රෝස ගසේ | | |

## 03) පුරුෂ ලිංග නාම පද සහ ස්ත්‍රී ලිංග නාම පද

01) කවිය කියවා පුරුෂ ලිංග නාම පද හා ස්ත්‍රී ලිංග නාම පද වෙන් කර ලියන්න.

| | | |
|---|---|---|
| 1. | ආදර වදනින් අප | සනසයි |
| | ආච්චි ගෙදරට | සිරියාවයි |
| | කතා කියා අප සතුටු | කරයි |
| | සීයා අපහට | කරුණාවයි |
| 2. | අලස නොවී උදයෙන් | පිබිදෙයි |
| | කුකුළා සුබ පතමින් | හඬලයි |
| | කිකිළිය කොක් කොක් නාදය | දෙයි |
| | පැටවුන් සමඟින් කෑම | සොයයි |
| 3. | කිසිවකුටත් හිරිහැර | නොකරයි |
| | මුවා අපේ හරි | අහිංසකයි |
| | සෙනෙහස දී රැකවරණය | දෙයි |
| | මුව දෙන පැටවුන් සමඟ | සිටියි |
| 4. | වංගෙඩි සේ පා තාලෙට | තබමින් |
| | ඇතා එන්නෙ හරි | ආඩම්බරයෙන් |
| | ඇතින්න පැටියව ළඟට | අරන් |
| | සෙනෙහස දෙයි සිත රැදි | සතුටින් |
| 5. | උදෑසනින් ම යි | නැගිටින්නේ |
| | කුරුල්ලා සතුටින් | පියඹන්නේ |
| | පැටවුන් අසලයි | ගැවසෙන්නේ |
| | කිරිල්ලියයි මේ නද | දෙන්නේ |
| 6. | හොඳ වැඩ පමණක් | කරනා |
| | මිතුරා වෙයි ඔබ | සැමදා |
| | සැප දුක දෙකෙහි ම | සිටිනා |
| | මිතුරිය ඔබ ම යි | සැමදා |

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද |
|---|---|
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |
| ……………………..…………… | ……………………………………... |

02) නිවැරදි පිළිතුර තෝරා හිස්තැනෙහි ලියන්න.
(ගිරවා, කොටියා, ගිරවිය, කොටි දෙන, නළුවා, නිළිය, සහෝදරයා, දුව, සහෝදරිය, පුතා)

1. .................... පැටවුන් සමඟ ගස් බෙනයේ සිටියි.
2. .................................... කැලයට පියඹා ගොස් කෑම සොයා ගෙන එයි.
3. ප්‍රධාන ................................ ගේ චරිතය රඟ දැක්වූයේ මිහිර ය.
4. ප්‍රධාන ............................ ගේ චරිතය රඟ දැක්වූයේ මිහිරි ය.
5. රුස්ස ගස උඩ අත්තක ................................ නිදයි.
6. ................................ පැටියා සමඟ ගස පාමුල නිදයි.
7. මගේ ................................ වන සුරංග කවි සැදීමට දක්ෂ ය.
8 මගේ ................................ වන සුරංගී ගීත ගායනයට දක්ෂ ය.
9. මිහිර ................................ චිත්‍ර තරගයට ඉදිරිපත් වෙයි.
10. මිහිරි ................................ නැටුම් තරගයට ඉදිරිපත් වෙයි.

## 04) ඒකවචන නාම පද සහ බහුවචන නාම පද

01) ඡේදය කියවා ඉරි ඇඳ ඇති නාම පද වලින් ඒකවචන නාම පද හා බහුවචන නාම පද වෙන් කර ලියන්න.

නැගෙනහිර අහසේ හිරු පායා ගෙන එන්නේ තවත් අලුත් දවසක් උදා කරමිනි. අද පාසල් නිවාඩු දිනයකි. මම උදෑසන ම පිබිදී මිදුලට ආවෙමි. වතුසුදු ගස මලින් පිරී ඇත්තේ සුදුමල් වට්ටියක් ලෙසිනි. කඩුපුල් ගසේ ඊයේ රෑ පිපුණු මල, පර වී ඇත. වෙන දා ට ආච්චි එය රාත්‍රියේ දී ම පූජා කරයි. වත්ත පහළ ගස්වල කුරුල්ලන්ගේ කිචි බිචි නාදයෙන් මුළු පරිසරය ම ප්‍රබෝධවත් වෙයි.

තාත්තා උදැල්ල ගෙන කුඹුරට යාමට සූදානම් වෙයි. අම්මා ලිහිලිහියේ ආහාර සූදානම් කරන්නේ අද ඇයත් කුඹුරට යන නිසා ය. මගේ යහළුවන්ගේ තාත්තලා ද කුඹුරු වැඩට යති. අම්මලා ද කුඹුරු වැඩට උදවුවට යති. නිවාඩු දිනයක් බැවින් මම ද කුඹුරට යන්නෙමි. එවිට මගේ යහළුවෝ ද කුඹුරේ දී හමුවෙති. අම්මලා, තාත්තලා කුඹුරු වැඩ අවසන් කරන තුරු අපි සෙල්ලම් කරන්නෙමු.

මගේ තාත්තා ගොවි කණ්ඩායමේ නායකයා මෙන් කටයුතු කරයි. නායක ගොවියා උදැල්ල කර තබා ගෙන කුඹුරට බසිද්දී අනෙක් ගොවියෝ ද උදලු කර තබා ගෙන, කුඹුරුවලට බසින්නේ පේළියකට ය.

කුඹුරු කෙටීම කණ්ඩායම් ලෙස එක් ව සිදු කරන අතර නියර බැඳීම ද කණ්ඩායම සාමූහික ව සිදු කරති. අපි නියර දිගේ පේළි සෑදී දුවන්නෙමු. වැඩ කරන අම්මලා, තාත්තලා වෙහෙස මහන්සි නිවා ගන්නටත්, ආහාර ගන්නටත් රැස් වන්නේ ගොඩපර ගස් සෙවණට ය. එකිනෙකා ගෙනෙන ලද ආහාර බෙදා හදාගෙන කෑමට හැකි වන නිසා අපි ද ඊට කැමැත්තක් දක්වමු. අව් රස්නය නිසා ලේන්නු, කුරුල්ලෝ ගොඩපර ගස්වලට වී සිටිති.

| ඒකවචන නාම පද | බහුවචන නාම පද |
|---|---|
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |
| …………………..…………… | ……………………………………... |

**02) දී ඇති නාම පදය අයත් වන්නේ ඒකවචන හා බහුවචන වර්ගයට දැයි හඳුනාගෙන හරි ලකුණ (√) යොදන්න.**

| නාම පදය | ඒකවචන | බහුවචන |
|---|---|---|
| පුටුව | √ | |
| පැන් | | |
| කරත්තය | | |
| ගුරුවරයා | | |
| පොත් | | |
| වෛද්‍යවරු | | |
| මල | | |
| පැන | | |
| තාත්තා | | |
| වෛද්‍යවරයා | | |
| පුටු | | |
| පොත | | |
| මල් | | |
| කරත්ත | | |
| තාත්තලා | | |
| ගුරුවරු | | |

**03)** පහත සඳහන් ඒකවචන හා බහුවචන නාම පද යොදා වාක්‍ය ලියන්න.
(පොත, පොත්, ළමයා, ළමයි, ශිෂ්‍යයා, ශිෂ්‍යයෝ, මල, මල්, උදැල්ල, උදලු)

උදා : - ළමයා සෙල්ලම් කරයි.
ළමයි සෙල්ලම් කරති.

1.......................................................................................................................................

2.......................................................................................................................................

3.......................................................................................................................................

4.......................................................................................................................................

5.......................................................................................................................................

6.......................................................................................................................................

7.......................................................................................................................................

8.......................................................................................................................................

9.......................................................................................................................................

10.....................................................................................................................................

## 05) අප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම.

**01)** ඡේදයේ ඇති අප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද යෙදෙන වාක්‍ය තෝරා ලියන්න.

**මා දුටු රෑ අහස**

නිල් අහසේ වලාකුළු ඒ මේ අත පා වෙයි. හිරු රැස් වැටී වලාකුළක් රිදී පාටට බබලයි. හිරු බැස යන අහසේ අලංකාරය වැඩි විය. කෑම සොයා ගිය කුරුල්ලෝ ආපසු කැදලි කරා පියාඹා යති. ටිකෙන් ටික අහස පුරා අඳුර පැතිරෙයි. පරිසරය අඳුරු වෙත් ම වවුලෝ කෑම සොයා පියාඹා යති. සඳ නැඟ එයි. සඳ එළියෙන් අහස ආලෝකවත් වෙයි. සඳ වටා ඇති තරු දිලිසෙයි. සිකුරු තරුව රන්වන් පාටට බබලයි. පරිසරය පුරා ම සිසිල් සුළඟක් හමා යයි. ඒ සුළඟේ මල් සුවඳ පැතිරී යයි. දහවලේ පිපෙන්නට සූදානම් වී තිබුණු කඩුපුල් මල පිපෙන තුරු අත්තම්මා බලා සිටියි. සේපාලිකා මල් සුවඳ දසත පැතිර යයි. පිපුණු සේපාලිකා මල් බිමට වැටෙයි. රාත්‍රියට පිපෙන මල් නිසා මුළු පරිසරය ම සුවඳවත් වෙයි. රෑ බෝ වත් ම බකමූණාගේ හූම් හූම් හඬ වැඩි වෙයි. ඒ හඬ නිසා රාත්‍රිය බිය ගන්වයි. කඩුපුල් මල පිපෙයි. අත්තම්මා එය කඩයි. පැන් ඉස බුදුරදුන්ට පුදයි.

- අප්‍රාණවාචී ඒකවචන වාක්‍ය

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

- අප්‍රාණවාචී බහුවචන වාක්‍ය

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

......................................................................................................................................

02) අප්‍රාණවාචී ඒකවචන නාම පද හා අප්‍රාණවාචී බහුවචන නාම පද යෙදී ඇති වාක්‍ය 5 බැගින් ලියන්න.

1........................................................................................................................................
2........................................................................................................................................
3........................................................................................................................................
4........................................................................................................................................
5........................................................................................................................................
1........................................................................................................................................
2........................................................................................................................................
3........................................................................................................................................
4........................................................................................................................................
5........................................................................................................................................

## 06) ප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද සහිත වර්තමාන කාල වාක්‍ය ලිවීම.

01) ඡේදයේ ඇති ප්‍රාණවාචී ඒකවචන නාම පද හා බහුවචන නාම පද යෙදෙන වාක්‍ය තෝරා ලියන්න.

### සෙල්ලම් ගෙදර

පාසල් නිවාඩුව ආරම්භ විය. කවිඳු, කවීෂා, නාමල්, පියුමි හා පියුමාල් කාව්‍යාගේ නිවසට පැමිණෙති. යහළුවෝ සෙල්ලම් ගෙයක් සෑදීමට තීරණය කරති.

සෙල්ලම් ගෙයක් සාදා දෙන ලෙස කාව්‍යා තම තාත්තාට කියයි. කාව්‍යාගේ තාත්තා සෙල්ලම් ගෙයක් සාදා දෙයි. සෙල්ලම් ගෙදරට අවශ්‍ය දේ යහළුවෝ තම තමන්ගේ නිවෙස්වලින් රැගෙන එති.

"සෙල්ලම් ගෙදර අම්මා මම යි" කාව්‍යා පවසයි. "තාත්තා කවුද?" යහළුවෝ අසති. "තාත්තා වෙන්නේ මම යි" නාමල් පවසයි. සෙල්ලම් ගෙදර නැන්දා කවීෂා යි. මාමා ලෙස කවිඳු ඉදිරිපත් වෙයි. යහළුවන් අතරින් පියුමි සහ පියුමාල් පුංචි ම ළමයි වෙති. ඒ දෙදෙනා සෙල්ලම් ගෙදර දුව සහ පුතා ලෙස පත් වෙති.

ළමයි සෙල්ලම් කිරීමට පටන් ගනිති. සෙල්ලම් ගෙදර අම්මා බත් උයයි. තාත්තා රැකියාවට යයි. නැන්දා ගෙදර බඩුමුට්ටු පිළිවෙළකට සකස් කරයි. මාමා කඩයට ගොස් බඩු ගෙනෙයි. දුව බෝනික්කා නළවයි. පුතා මිදුලේ බෝල ගසයි.

- ප්‍රාණවාචී ඒකවචන වාක්‍ය

.............................................................................................................
.............................................................................................................
.............................................................................................................
.............................................................................................................
.............................................................................................................

- ප්‍රාණවාචී බහුවචන වාක්‍ය

.............................................................................................................
.............................................................................................................
.............................................................................................................
.............................................................................................................
.............................................................................................................

**02)** ප්‍රාණවාචී ඒකවචන නාම පද හා ප්‍රාණවාචී බහුවචන නාම පද යෙදී ඇති වාක්‍ය **5** බැගින් ලියන්න.

1.............................................................................................................
2.............................................................................................................
3.............................................................................................................
4.............................................................................................................
5.............................................................................................................
1.............................................................................................................
2.............................................................................................................
3.............................................................................................................
4.............................................................................................................
5.............................................................................................................

**03)** පහත වාක්‍ය බහුවචන වාක්‍ය බවට හරවා ලියන්න.

**1**. ළමයා පොත් පාඩම් කරයි. - .............................................................
**2**. නංගී ගුවන්විදුලියට සවන් දෙයි.- .......................................................
**3**. අම්මා ලස්සන කතන්දරයක් පවසයි.- ....................................................

4. අයියා පාසල් යයි. - ..........................................................................................

5. අලියා කොට අදියි. - ..........................................................................................

04) පහත වාක්‍ය ඒකවචන වාක්‍ය බවට හරවා ලියන්න.

1. තාත්තලා ශ්‍රමදානයට සහභාගි වෙති.. - ..........................................................................

2. ගුරුවරු පාසල් යති.- ..................................................................................................

3. වෛද්‍යවරු රෝගීන් පරීක්ෂා කරති. - ..............................................................................

4. අශ්වයෝ වේගයෙන් දුවති.- ..........................................................................................

5. මොනරු පිල් විදහා නටති.- ..........................................................................................

## 07) "ඇ/ඇය, ඔහු, ඌ" නාම පද උක්තය ලෙස යෙදුණු වර්තමාන කාල වාක්‍ය ලිවීම

01) ඡේදය ඇසුරෙන් වාක්‍ය ලියන්න.

මගේ නම ප්‍රවීන් කරුණාරත්න යි. මගේ අම්මාගේ නම සුජීවා වික්‍රමරත්න යි. ඇය හරි ම ලස්සන යි. ඇය ගුරුවරියකි. ඇය බෝමිරිය මහා විද්‍යාලයයේ සේවය කරයි. අම්මාගේ විනෝදාංශය පොත් කියවීම යි.

මගේ තාත්තාගේ නම සජිත් කරුණාරත්න යි. ඔහු තරමක් උසයි. තාත්තා වෙළඳ ව්‍යාපාරිකයෙකි. ඔහුගේ ව්‍යාපාරයේ බොහෝ සේවකයෝ සිටිති. තාත්තාගේ එක ම විනෝදාංශය වන්නේ නංගීත් මාත් සමඟ සෙල්ලම් කිරීම ය.

මගේ සුරතලා බූලා යි. ඌ මා සමඟ සෙල්ලම් කිරීමට මහත් සේ ප්‍රිය කරයි. මා පාසල නිම වී නිවසට එන තෙක් බූලා මඟ බලා සිටියි. ඌ මඟ බලා සිටින්නේ මා සමඟ සෙල්ලම් කිරීමට යි.

අම්මා

1. මගේ අම්මාගේ නම සුජීවා වික්‍රමරත්න යි.

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

5. ..........................................................................................................................

තාත්තා

1. මගේ තාත්තාගේ නම සජිත් කරුණාරත්න යි.

2. ..........................................................................................................................

3. ..........................................................................................................................

4. ..........................................................................................................................

5. ..........................................................................................................................

බූලා

1. මගේ සුරතලා බූලා යි.
2. ...........................................................................................................
3. ...........................................................................................................
4. ...........................................................................................................
5. ...........................................................................................................

02) දී ඇති වාක්‍යයට පසු ව "ඇ/ඇය, ඔහු, ඌ" ලෙස ගැලපෙන පරිදි යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

1. තාත්තා මිදුලේ සිටියි. .............. එළවළු පාත්තිවලට පොහොර දමයි.
2. අම්මා කුස්සියේ සිටියි. .............. රස කෑමක් සාදයි.
3. මල්ලී සෙල්ලම් කරයි. .............. සෙල්ලම් කාර්, බස්වලට බොහෝ කැමතියි.
4. සිංහයා ගස යට නිදයි. ............... දඩයම ප්‍රිය කරයි.
5. වෛද්‍යවරිය බොහෝ කාරුණික යි. .............. රෝගියාට කරුණාවෙන් කතා කරයි.

03) කැමති මාතෘකාවක් යටතේ වාක්‍ය 5ක් ලියන්න. එහි දී "ඇ/ඇය, ඔහු, ඌ" පද යොදන්න.

උදා : 1. මගේ හොඳ ම යහළුවා
2. මගේ සොහොයුරා/සොහොයුරිය
3. මා කැමති ම සතා .............. යි.

1. ...........................................................................................................
2. ...........................................................................................................
3. ...........................................................................................................
4. ...........................................................................................................
5. ...........................................................................................................

## 08) "ඔවුහු" යෙදුණු වර්තමාන කාල වාක්‍ය ලිවීම.

01) ඡේදය ඇසුරෙන් වාක්‍ය ලියන්න.

දීප්ති සහ සිත්මි හොඳ මිතුරියෝ ය. ඔවුහු විවේකයෙන් සිටින විට පුස්තකාලයට යති. පොත් කියවති. පොත් කියවීම හොඳ පුරුද්දක් බව ඔවුහු පවසති.

සිතුම් හා දෙනෙත් හොඳ මිතුරෝ ය. ඔවුහු විවේකයෙන් සිටින විට පුවත්පත් කියවති. තොරතුරු දැනගනිති. පුවත්පත් කියවීම හොඳ පුරුද්දක් බව ඔවුහු පවසති.

දීප්ති, සිත්මි හා සිතුම් හොඳ මිතුරු මිතුරියෝ ය. ඔවුහු විවේකයෙන් සිටිනා විට දැනුම මිනුම තරග පවත්වති. ඒවායින් දැනුම හුවමාරු කරගත හැකි බව ඔවුහු පවසති.

**දීප්ති සහ සිත්මි**

01) දීප්ති සහ සිත්මි හොඳ මිතුරියෝ ය.
02) ...........................................................................................................
03) ...........................................................................................................
04) ඔවුහු පොත් කියවීම හොඳ පුරුද්දක් බව පවසති.

**සිතුම් සහ දෙනෙත්**

01) සිතුම් සහ දෙනෙත් හොඳ මිතුරෝ ය.
02) ...........................................................................................................
03) ...........................................................................................................
04) ඔවුහු පුවත්පත් කියවීම හොඳ පුරුද්දක් බව පවසති.

**දීප්ති, සිත්මි සහ සිතුම්**

01) දීප්ති, සිත්මි සහ සිතුම් හොඳ මිතුරු මිතුරියෝ ය.
02) ...........................................................................................................
03) ...........................................................................................................
04) ඔවුහු දැනුම හුවමාරු කර ගනිති.

02) දී ඇති වාක්‍යයට පසුව "ඔවුහු" යොදා වාක්‍ය ගොඩනගා ලියන්න.

1. මලිති සහ මලී දිනපතා පුවත්පත් කියවති.

...........................................................................................................

2. මනුක සහ රන්දික විවේක අවස්ථාවල දී හමු වෙති.

...........................................................................................................

3. මලිත්, මලී සහ රන්දික පුවත්පත් කියවති.

...........................................................................................................

4. දීප්ති, සිතුම් සහ දෙනෙත් උදෑසන අවදි වෙති.

...........................................................................................................

5. සිත්මි, මලිති සහ රන්දික ගුරුවරුන්ගේ අවවාද පිළිගනිති.

...........................................................................................................

## 09) "මම, අපි" සමඟ ක්‍රියාපදයේ භාවිතය - වර්තමාන කාලය.

01) කවියේ සඳහන් ඒකවචන හා බහුවචන වාක්‍ය වෙන් කර ලියන්න.

| | | | |
|---|---|---|---|
| මම පොතක් | කියවමි | අපි පොත් | කියවමු |
| මම කරුණු රැස් | කරමි | අපි කරුණු රැස් | කරමු |
| එම කරුණු | ලියමි | එම කරුණු | ලියමු |
| නැවත ඒවා | කියවමි | නැවත ඒවා | කියවමු |
| මම පාඩම් | කරමි | අපි පාඩම් | කරමු |
| හොඳින් පිළිතුරු | ලියමි | හොඳින් පිළිතුරු | ලියමු |
| මම ජයක් | ලබමි | අපි ජයක් | ලබමු |
| රටට සේවය | කරමි | රටට සේවය | කරමු |

<u>මම</u>

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................
5. ..............................................................................................................
6. ..............................................................................................................
7. ..............................................................................................................
8. ..............................................................................................................

<u>අපි</u>

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................
4. ..............................................................................................................
5. ..............................................................................................................
6. ..............................................................................................................
7. ..............................................................................................................
8. ..............................................................................................................

02) පහත සඳහන් ඒකවචන වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

1. මම මල් පැළ සිටුවමි.
   අපි මල් පැළ සිටුවමු.
2. මම බසයට නඟිමි. ..............................................................................
3. මම පොත් බෑගයට දමමි. ..............................................................................
4. මම උදේ ම පාසලට යමි. ..............................................................................
5. මම අම්මාට උදවු කරමි. ..............................................................................
6. මම පූසාට කිරි සාදා දෙමි. ..............................................................................

03) පහත සඳහන් බහුවචන වාක්‍ය ඒකවචනයට හරවා ලියන්න.

1. අපි මල් කඩමු.
   මම මල් කඩමි.
2. අපි දවසට දෙවරක් දත් මදිමු. ..............................................................................
3. අපි දිනපතා පාසල් යමු. ..............................................................................
4. අපි මල් පැළවලට වතුර දමමු. ..............................................................................
5. අපි කතන්දර පොත් කියවමු. ..............................................................................
6. අපි නිවැරදි ව අකුරු ලියමු. ..............................................................................

04) වාක්‍ය නිවැරදි ව සකස් කර ලියන්න.

1. මම/චිත්‍රයක්/අඳිමි/ලස්සන
   මම ලස්සන චිත්‍රයක් අඳිමි.
2. ගුරුවරුන්ට/අපි/කීකරු/වෙමු. ..................................................
3. කියවමි/කතන්දර/මම/පොතක් ..................................................
4. අපි/සෙල්ලම්/කරමු/සමගියෙන් ..................................................
5. වෙමි/මම/උදෙන් ම/අවදි ..................................................
6. ඉදුණු/අඹ/කඩමු/අපි ..................................................

## 10) ස්ත්‍රීලිංග ඒකවචන නාම පද හා පුරුෂලිංග ඒකවචන නාම පද සහිත අතීත කාල වාක්‍ය

01) ඡේදය කියවා වර්තමාන කාල වාක්‍ය හා අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

ලේනා අඹ කයි. කුරුල්ලා කෑම සොයා පියැඹුවේය. නැන්දා ඇඳුමක් මැසුවා ය. සඳුන් බටනලාව වාදනය කරයි. විදුහල්පතිතුමා උදෑසන රැස්වීම ඇමතුවේ ය. සීයා රසවත් කතන්දරයක් පවසයි. සඳුනි චිත්‍රයක් ඇන්දා ය. පසිඳු ලියුමක් ලිවුවේය. රියදුරා බසය පදවයි. මොනරා පිල් විදහා නටයි.

**වර්තමාන කාලය**

1. ..................................................
2. ..................................................
3. ..................................................
4. ..................................................
5. ..................................................

**අතීත කාලය**

1. ..................................................
2. ..................................................
3. ..................................................
4. ..................................................
5. ..................................................

02) ඡේදය කියවා වර්තමාන කාල වාක්‍ය හා අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.

නිවස ඉදිරිපිට සිට බල්ලා නොනවත්වා බුරයි. පාරේ සිට මිදුල දක්වා ඇත්තේ මීටර් 300ක පමණ දුරකි.

"අම්මේ . . . කුමාරි නැන්දලා එනවා" යැයි මා පැවසුවේ ඉමහත් සතුටකිනි. කුමාරි නැන්දා "සිරි නිවස" යැයි අපගේ නිවසට කියයි. කුමාරි නැන්දාත්, කුමාර මාමාත් අපේ නිවසට එන තෙක් අප කවදත් සිටින්නේ නොඉවසිල්ලෙනි.

"කුමාරි නැන්දේ, කුමාර මාමේ"යැයි මල්ලී නොනවත්වා කියවයි. මල්ලීට තව ම අවුරුදු හතරකි. කුමාරි නැන්දා රසවත් කතන්දර පවසයි. මල්ලී ඒවා අසා විනෝද වෙයි.

"සතුටින් සිටීම නිරෝගිකමටත් හේතුවක් වෙනවා" යැයි දිනක් සීයා පැවසුවේ ය.

සවස් වන විට තාත්තා නිවසට පැමිණියේ ය. තාත්තා නිවසට පැමිණි විට අපගේ සිත් තවත් සතුටින් පිරෙන්නේ නොදැනුවත්ව ම ය.

රාත්‍රි ආහාරයෙන් පසු ව කුමාර මාමා ලස්සනට බටනලාව වාදනය කළේය. අම්මා ගීතයක් ගැයුවා ය. අම්මා ගීතයක් ගයන සෑම විට ම මල්ලී තාලයට නටයි. එය ඔහුගේ පුරුද්දකි.

අනතුරු ව අප සියලු දෙනා ම නිඳා ගැනීමට ගියේ අපමණ සතුටකිනි.

**වර්තමාන කාලය**

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................
5. ..............................................................................................................................

**අතීත කාලය**

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................
5. ..............................................................................................................................

**03) පැවරුම් පත කියවා ස්ත්‍රීලිංග ඒකවචන අතීත කාල වාක්‍ය සහ පුරුෂලිංග ඒකවචන අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.**

අම්මා ලස්සන සාරියක් ඇන්දා ය.
රියදුරා බස් රථය පැදවූවේ ය.
ගිරවා ඉදුණු අඹ ගෙඩියක් කෑවේ ය.
නංගී කතන්දර පොතක් කියෙවුවා ය.
විදුහල්පතිතුමිය හරවත් කතාවක් කළා ය.
චාමර කෞතුකාගාරය නැරඹුවේ ය.
තාත්තා උදෑසනින් ම රැකියාවට ගියේ ය.
මොනරා පිල් විදහා නැටුමක් නැටුවේ ය.
වෛද්‍යවරයා රෝහලෙහි සිටියේ ය.
ගුරුතුමිය ගීතයක් ගැයුවා ය.
අයියා රචනාවක් ලිවුවේ ය.
හිරුණි බත් කෑවා ය.

### ස්ත්‍රීලිංග ඒකවචන අතීත කාල වාක්‍ය

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................
6. ..........................................................................................................

### පුරුෂලිංග ඒකවචන අතීත කාල වාක්‍ය

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................
6. ..........................................................................................................

**04) ඡේදය කියවා ස්ත්‍රීලිංග ඒකවචන අතීත කාල වාක්‍ය සහ පුරුෂලිංග ඒකවචන අතීත කාල වාක්‍ය වෙන් කර ලියන්න.**

> සෙනසුරාදා දිනය අප පවුලේ සැම දෙනාට ම නිවාඩු දිනයකි. තාත්තා උදෑසන ම පත්තරය කියෙවුවේය. නිවාඩු දිනවල අම්මා උදෑසන ආහාරය සඳහා රසවත් ආහාර වේලක් සකසන බව අප සැමදෙනා ම දනියි. අම්මා අද කිරිබත් සහ ලුණු මිරිස් සෑදුවා ය. මල්ලී ආශාවෙන් කිරිබත් කෑවේ ය. නංගී කිරිබත් කා උණු තේ කෝප්පයක් බිවුවා ය. අප කෑම කන විට පූසා මේසය යට සිටියේ ය. පුංචි පූසි පැටියා ද පුරු පුරු ගාමින් ඒ අසල ම රැඳුණා ය.
>
> අම්මේ . . . තාත්තේ . . . අපි අද මොකද කරන්නේ යැයි නංගී ඇසුවාය. "අපි අද එළවළු පාත්තියට පොහොර දමමු" යැයි තාත්තා එකවරට ම පැවසුවේය. අම්මා ද ඒ අදහස හොඳ බව අනුමත කළාය.
>
> එදින සවස් වන විට සෙනසුරාදා දින ප්‍රයෝජනවත් ලෙස ගත කළ බව අප සැමට ම අවබෝධ වූහ.

### ස්ත්‍රීලිංග ඒකවචන අතීත කාල වාක්‍ය

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................
6. ..........................................................................................................

පුරුෂලිංග ඒකවචන අතීත කාල වාක්‍ය

1. ..............................................................................................

2. ..............................................................................................

3. ..............................................................................................

4. ..............................................................................................

5. ..............................................................................................

6. ..............................................................................................

## <u>11) ස්ත්‍රීලිංග බහුවචන නාම පද හා පුරුෂලිංග බහුවචන නාම පද සහිත අතීත කාල වාක්‍ය</u>

01) පහත වාක්‍ය ඒකවචන අතීත කාල වාක්‍ය සහ බහුවචන අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

සමන් තාලයට නැටුවේ ය.
මල්ලිලා චිත්‍ර ප්‍රදර්ශනය නැරඹුවෝ ය.
අයියලා සෙල්ලම් කළෝ ය.
විදුහල්පතිතුමිය උදෑසන රැස්වීම ඇමතුවා ය.
තාත්තලා ශ්‍රමදානයට ගියහ.
සීයා පුවත්පතක් කියෙවුවේ ය.
වෛද්‍යවරයා රෝගය පිළිබඳ දූන සිටියේ ය.
අම්මා ප්‍රවෘත්ති විකාශයට සවන් දුන්නා ය.
අක්කා කෙටිකතාවක් ලිවුවා ය.
ගුරුවරු පාසලට පැමිණිය හ.

ඒකවචන අතීත කාල වාක්‍ය

1. ..............................................................................................

2. ..............................................................................................

3. ..............................................................................................

4. ..............................................................................................

5. ..............................................................................................

6. ..............................................................................................

බහුවචන අතීත කාල වාක්‍ය

1. ..............................................................................................

2. ..............................................................................................

3. ..............................................................................................

4. ..............................................................................................

5. ..............................................................................................

6. ..............................................................................................

02) පහත ජේදයේ ඇතුලත් වාක්‍ය ඒකවචන අතීත කාල වාක්‍ය සහ බහුවචන අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

> හිරු උදා විය. එහෙත් වෙනදා තරම් හිරු රැස් ප්‍රබල නොවීය. අවට පරිසරයෙන් දිස් වූයේ මලානික පෙනුමකි.
>
> "අද නම් වහින්න වගෙයි" තාත්තා කිවුවේ ය. "මෙච්චර දවසක් පැවුවා නේ. වහින එක නම් හොඳ යි" අම්මා ද සිය අදහස පළ කළා ය.
>
> "අම්මේ . . . මම පාඩම් කරලා ඉවරයි. මම නංගිලා එක්ක සෙල්ලම් කරන්න ද ?" අක්කා අම්මාගෙන් ඇසුවා ය. නංගිලා ද පාඩම් වැඩ කළහ. අනතුරු ව නංගිලා සෙල්ලම් ගෙදරක් දැමුවෝ ය. අක්කා ද ඒ සඳහා එක් වුණා ය.
>
> "වැස්ස නම් අත ළඟ යි. අද ඉතිං ගේ ඇතුළට ම වෙලා තමයි ඉන්න වෙන්නේ" සීයා වැස්ස පිළිබඳ ව සිය අදහස් ප්‍රකාශ කළේ ය.
>
> "අම්මේ . . . අන්න නැන්දා එනවා" කියමින් අක්කා ඒ දෙසට දිවුවා ය. "ආ . . . මේ නංගිලා නේ. ආව එක හොඳ යි." තාත්තා සාලයේ සිට පැවසුවේ ය.
>
> "එන්න නංගී අපි තේ බොමු. හැමෝම එන්න තේ බොන්න" යැයි අම්මා හඬ නඟා පැවසුවා ය.
>
> "අග්ගලා හරි ම රස යි අක්කේ" යැයි නැන්දා සතුටින් කිවුවා ය. මල්ලිලා, අග්ගලා දෙකක් අතට ගත්හ. නංගිලා තේ බිවුවෝ ය.
>
> අද දවස සතුටින් ගත කළ හැකි යැයි මට සිතුණි.

ඒකවචන අතීත කාල වාක්‍ය

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................
4. ........................................................................................................................
5. ........................................................................................................................
6. ........................................................................................................................

බහුවචන අතීත කාල වාක්‍ය

1. ........................................................................................................................
2. ........................................................................................................................
3. ........................................................................................................................
4. ........................................................................................................................
5. ........................................................................................................................
6. ........................................................................................................................

03) පහත පැවරුම්පතේ ඇතුලත් ඒකවචන අතීත කාල වාක්‍යයට ගැළපෙන බහුවචන අතීත කාල වාක්‍ය යා කරන්න.

| ඒකවචන අතීත කාල වාක්‍ය | බහුවචන අතීත කාල වාක්‍ය |
|---|---|
| * මල්ලී රචනාවක් ලිව්වේ ය. | * ගිරවු අඹ කෑවෝ ය. |
| * නැන්දා වැලිතලප සෑදුවා ය. | * අක්කලා මිදුල අතුගෑවෝ ය. |
| * සීයා ගමට ගියේ ය. | * මල්ලිලා රචනා ලියූහ. |
| * අක්කා මිදුල අතුගෑවා ය. | * නැන්දලා වැලිතලප සෑදූහ. |
| * අයියා පොතක් අතට ගත්තේ ය. | * සීයලා ගමට ගියෝ ය. |
| * ගිරවා අඹ කෑවේ ය. | * අයියලා පොත් අතට ගත්හ. |

**04)** සුදුසු අතීත කාල ක්‍රියා පද වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

1. ගොවියෝ උදෑසනින් ම කුඹුරට ................................. (ගියා ය/ගියහ)
2. කුරුල්ලෝ සවසට තම කැදලි කරා ................................. (ආවෝ ය/ආවේ ය)
3. සමනලයෝ මල් පැණි ................................. (බිව්වේ ය/බිව්වෝ ය)
4. මල්ලිලා සමගියෙන් සෙල්ලම් ................................. (කළහ/කළෝ ය)
5. යහ!එවෝ අපගේ නිවසට ................................. (පැමිණියෝ ය/පැමිණියා ය)
6. ක්‍රීඩකයෝ තරගයෙන් ජයග්‍රහණය ................................. (ලැබූහ/ලැබුවේ ය)
7. සත්තු වේගයෙන් කැලයට ................................. (දිවුවෝ ය/දිව්වේ ය)
8. ගිරවු ජම්බු ගසේ ................................. (සිටියහ/සිටියේ ය)

**05)** පහත වාක්‍ය බහුවචන අතීත කාලයට හරවා ලියන්න.

1 ගොවියා උදැල්ල ගෙන කුඹුර කෙටුවේ ය.

.............................................................................................................................

2 මල්ලී පත්තරය කියෙව්වේ ය.

.............................................................................................................................

3 රජතුමා රට පාලනය කළේ ය.

.............................................................................................................................

4 නැන්දා හැළප සෑදුවා ය.

.............................................................................................................................

5 මොනරා පිල් විදහා නැටුවේ ය.

.............................................................................................................................

6 බල්ලා වේගයෙන් දිව්වේ ය.

.............................................................................................................................

7 ලේඛකයා කෙටිකතාවක් ලිවුවේ ය.

.............................................................................................................................

8 කිරිල්ලිය පැටවා සුරතල් කළා ය.

.............................................................................................................................

**06)** පහත වාක්‍ය ඒකවචන අතීත කාලයට හරවා ලියන්න.

1 කුරුල්ලෝ කැදලි කරා පියඹා ගියෝ ය.

.............................................................................................................................

2 වඳුරෝ ගසින් ගසට පැන නැටූහ.

.................................................................................................................................................

3 ලේන්නු ඉදුණු අඹ කෑවෝ ය.

.................................................................................................................................................

4 කිරිල්ලියෝ පැටවුන්ට කෑම දුන්හ.

.................................................................................................................................................

5 වෛද්‍යවරියෝ රෝගීන් පරීක්ෂා කළෝ ය.

.................................................................................................................................................

6 මාමලා නිවසක් සෑදූහ.

.................................................................................................................................................

7 නැන්දලා ඇඳුම් මැසුවෝ ය.

.................................................................................................................................................

8 ශිෂ්‍යාවෝ ඉතා උනන්දුවෙන් පාඩම් කළහ.

.................................................................................................................................................

07) දී ඇති වාක්‍යවලට ගැළපෙන ඒකවචන අතීත කාල වාක්‍ය හෝ බහුවචන අතීත කාල වාක්‍ය හෝ ලියන්න.

1 ශිෂ්‍යයෝ පුස්තකාලයට ගියෝ ය.

.................................................................................................................................................

2 ගුරුවරු හොඳින් පාඩම් ඉගැන්වූහ.

.................................................................................................................................................

3 විදුහල්පතිතුමිය පන්ති නිරීක්ෂණය කළා ය.

.................................................................................................................................................

4 ගොවිලියෝ කුඹුරට ඇඹුල ගෙන ගියහ.

.................................................................................................................................................

5 වඩුවා පුටුව සෑදුවේ ය.

.................................................................................................................................................

6 විදේශිකයෝ සීගිරිය නැරඹූහ.

.................................................................................................................................................

7 ක්‍රීඩිකාව පුහුණුවීම් කටයුතු කළා ය.

.................................................................................................................................................

8 ළමයි පුස්තකාලයට ගොස් පොත් කියෙවුවෝ ය.

.................................................................................................................................................

08) දී ඇති වාක්‍ය ඒකවචන අතීත කාල නම් ඊට ඉදිරියෙන් √ ලකුණත්, දී ඇති වාක්‍ය බහුවචන අතීත කාල නම් ඊට ඉදිරියෙන් √ ලකුණත් යොදන්න.

| වාක්‍යය | ඒකවචන අතීත කාල | බහුවචන අතීත කාල |
|---|---|---|
| සමනලයා මල්පැණි බිවුවේ ය. | | |
| හාවා පැන පැන ගියේ ය. | | |
| තාත්තලා වැඩට ගියහ. | | |
| වෛද්‍යවරු රෝහලේ සිටියෝ ය. | | |
| අම්මලා කෑම සැදූහ. | | |
| යහළුවෝ සෙල්ලම් කළෝ ය. | | |
| වඳුරා ගස් උඩ පැන නැටුවේ ය. | | |
| ලේනා අඹ අත්ත උඩ සිටියේ ය. | | |
| ක්‍රීඩකයෝ ක්‍රීඩා පිටියට පැමිණියෝ ය. | | |
| ගායිකාව ගීතයක් ගැයුවා ය. | | |

## 12)"ඈ/ඇය" යෙදුණු අතීත කාල වාක්‍ය

01) දී ඇති ඡේදවල "ඈ/ඇය" යන්න සමග යෙදී ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියන්න.

### අපේ ආච්චි අම්මා

පාසල් නිවාඩු කාලය අපහට ඉතා ම ප්‍රීතිමත් කාලයක් විය. නිවාඩු කාලයට ආච්චි අම්මා අප නිවසට පැමිණියා ය. ඈ බොහෝ වේලාවක් අප සමග කාලය ගත කළා ය. ඇය අප කැමති කෑම වර්ග සාදා දුන්නා ය. ඈ නිතර ම අප කැමති දේ පිළිබඳ විමසිලිමත් වූවා ය.

අපගේ ශරීර සෞඛ්‍ය පවත්වාගෙන යන අන්දම ආච්චි අම්මා පැහැදිලි කර දුන්නා ය. ඈ අපව නෑවුවා ය. ඇය අපගේ කොණ්ඩ පීරුවා ය. ඈ රසවත් කවි, කතන්දර කියා දුන්නා ය.

පාසල් වැඩවල දී ද ඇයගේ සහාය නොමදව ලැබුණි. ඇය නිසා පාසල් නිවාඩු කාලය ඵලදායි ව හා ප්‍රීතිමත් ව ගත කළ හැකි විය.

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................
4. ........................................................................................................
5. ........................................................................................................
6. ........................................................................................................

## මගේ ගුරුතුමිය

මගේ පාසල් කාලය ඉතා ම සුන්දර ය. මගේ ගුරුතුමී නිසා මගේ පාසල් කාලය බොහෝ සුන්දර විය. ඈ නිතර ම සිනාමුසු මුහුණින් යුතු ව සිටියා ය. ඈ කාහටත් කරුණාවෙන් කතා කළාය. ඇය සැමට ම තේරුම් ගත හැකි ලෙස පාඩම් පැහැදිලි කර දුන්නා ය.

අප අභ්‍යාසයක් නිවැරදි ව කළ විට ඇය දිග හරියක් දුන්නා ය. ඇය හොඳ දුව, හොඳ පුතා යැයි අපව ඇමතුවා ය.

ඇය වැනි ගුරුතුමියක මා හට හමු වී නැත. ඇයගේ ජීවිතය සැමදා යහපත් වනු ඇත.

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................
4. ........................................................................................................
5. ........................................................................................................

02) පහත සඳහන් වගුවේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

ඈ තරගයෙන් ජයග්‍රහණය කරයි.
ඇය වයලීනය අතට ගත්තා ය.
ඈ නිවස සුද්ද පවිත්‍ර කළා ය.
ඇය පිළිවෙලකට පොත් අසුරයි.
ඈ ලස්සන ඇඳුමක් මසයි.
ඇය ශබ්ද නගා පොත කියෙව්වා ය.
ඈ චිත්‍රපටයක් බලයි.
ඇය බෝනික්කා නැළෙව්වා ය.
ඇය මිහිරි හඬින් ගීයක් ගයයි.
ඈ ඉදුණු පලතුරු කෑවා ය.

### වර්තමාන කාල වාක්‍ය

1. ........................................................................................................
2. ........................................................................................................
3. ........................................................................................................
4. ........................................................................................................
5. ........................................................................................................

### අතීත කාල වාක්‍ය

1. ........................................................................................................
2. ........................................................................................................

3. ..................................................................................................................................

4. ..................................................................................................................................

5. ..................................................................................................................................

03) පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

1. ඈ බොහෝ වේලාවක් පාඩම් කරයි.

..................................................................................................................................

2. ඇය දිනකට දෙවරක් දත් මදියි.

..................................................................................................................................

3. ඈ අලංකාර කවි පන්තියක් ලියයි.

..................................................................................................................................

4. ඇය සතුටින් සිනාසෙයි.

..................................................................................................................................

5. ඈ තාලයට නටයි.

..................................................................................................................................

04) පළමු වාක්‍ය දෙස බලා ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා ලියන්න.

(ඈ රසවත් කෑමක් සෑදුවා ය, ඇය පාසලට පැමිණියා ය, ඈ පාඩම් කළා ය, ඈ රෝගීන් පරීක්ෂා කළා ය, ඇය පාසලේ දී හැසිරිය යුතු අයුරු පැවසුවා ය.)

1. ගුරුතුමිය ලස්සන සාරියක් ඇන්දා ය.

..................................................................................................................................

2. වෛද්‍යවරිය කඩිනමින් රෝහලට ගියා ය.

..................................................................................................................................

3. අම්මා මුළුතැන්ගෙයට ගියා ය.

..................................................................................................................................

4. අක්කා උදෙන් ම අවදි වූවා ය.

..................................................................................................................................

5. විදුහල්පතිතුමිය පන්ති කාමරයට ආවා ය.

..................................................................................................................................

05) පළමු වාක්‍ය තුන කියවා එම රටාව අවබෝධ කරගෙන දී ඇති හිස්තැනෙහි ඈ/ඇය පදය යොදා නිදහසේ වෙනත් වාක්‍ය ගොඩනඟා ලියන්න.

සඳුනි

1. සඳුනි මගේ යෙහෙළියකි.
2. ඈ පාසල් වැඩ හොඳින් කළා ය.
3. ඇය ජයග්‍රහණ අත්පත් කර ගත්තා ය.

පියුමි

1. පියුමි මගේ යෙහෙළියකි.

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

ආච්චි අම්මා

1. මගේ ආච්චි අම්මා බුද්ධිමත් කාන්තාවකි.
2. ඇ දිනපතා පුවත්පත් කියෙවුවා ය.
3.ඇය රට, ලෝකය පිළිබඳ බොහෝ දේ දන සිටියා ය.

ආච්චි අම්මා

1. මගේ ආච්චි අම්මා නිරෝගී ය.

2. ..............................................................................................................

3. ..............................................................................................................

නංගී

1. මගේ නංගී යහපත් දැරියකි.
2. ඇ විනෝදාංශය ලෙස පොත් කියෙවුවා ය.
3. ඇය විවේකය ඵලදායී ව ගත කළා ය.

නංගී

1. මගේ නංගී යහපත් දැරියකි.

2. ..............................................................................................................

3. ..............................................................................................................

## 13)"ඔහු" යෙදුණු අතීත කාල වාක්‍ය

01) දී ඇති ජේදවල "ඔහු" යන්න සමඟ යෙදී ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියන්න.

### අලුත් අවුරුදු කාලය

අලුත් අවුරුදු කාලය වසරේ ප්‍රීතිමත් ම කාලය යි. තාත්තා දුර බැහැර රැකියාව කිරීමට පෙර කාලයේ ඒ ප්‍රීතිමත් බව කියා නිම කළ නොහැකි ය. අවුරුදු කාලයට අපේ තාත්තාට වැඩ බහුල වේ. ඔහු නිවසට බොහෝ දේ රැගෙන ආවේ ය. අවුරුදු කාලයට අවශ්‍ය ආහාර පාන සඳහා වන සෑම දෙයක් ම රැගෙන ඒම තාත්තාගේ සිරිතකි. ඔහු දවසේ බොහෝ වේලාවක් ගෙවත්තේ වැඩ කළේ ය.

සෑම අවුරුද්දක ම ඔහු නිවසේ බිත්ති ආලේප කළේ ය. කුඩා දරුවන් වන අපට ඔංචිල්ලාවක් බැඳ දුන්නේ ය. ඔහු අවුරුදු කැවිලි සෑදීමට අම්මාට උදවු කළේ ය.

අලුත් අවුරුද්දට බොහෝ වැඩ සිදුවන්නේ ඔහුගේ ම දෑතෙනි.

1. ..............................................................................................................

2. ..............................................................................................................

3. ..............................................................................................................

4. ..............................................................................................................

## මගේ ගුරුතුමා

මා පාසල් ගියේ බොහෝ කැමැත්තෙනි. ඒ මගේ පන්ති භාර ගුරුතුමා නිසා ය. මගේ පන්ති භාර ගුරුතුමා බොහෝ කරුණාවන්ත ය. ඔහු සැම දිනක ම පාසල් පැමිණියේ ය. උගන්වන දේ සරල ව, පැහැදිලි ව පැවසුවේ ය. උගන්වන දේ සැම දෙනාට ම අවබෝධ වූවා දැයි ඔහු නිතර ම විමසිලිමත් වූවේ ය.

මගේ ගුරුතුමා තාලයට කවි, ගීත ගැයුවේ ය. ඔහු මිහිරි ලෙස වයලීනය ද වැයුවේ ය. මගේ ගුරුතුමා නිසා මගේ පාසල් කාලය ප්‍රීතිමත් වූවා යැයි මට හැඟෙයි.

1. ..........

2. ..........

3. ..........

02) පහත සඳහන් වගුවේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

ඔහු කතරගම යයි.
ඔහු හරවත් කතාවක් කරයි.
ඔහු දිනපතා සතුන්ට කෑම දෙයි.
ඔහු පුවත්පත කියෙවුවේ ය.
ඔහු විනෝදාංශය ලෙස මුද්දර එකතු කළේ ය.
ඔහු උදෑසනින් පාසලට ගියේ ය.
ඔහු පුස්තකාලයෙන් පොතක් ගත්තේ ය.
ඔහු කෑමට පෙර අත් සෝදයි.
ඔහු දිනපතා උදෑසනින් අවදි වෙයි.
ඔහු තාලයට ගීතයක් ගැයුවේ ය.

### වර්තමාන කාල වාක්‍ය

1. ..........
2. ..........
3. ..........
4. ..........
5. ..........

### අතීත කාල වාක්‍ය

1. ..........
2. ..........

3. ..................................................................................................................................

4. ..................................................................................................................................

5. ..................................................................................................................................

03) පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

1. ඔහු දිනපතා පාසල් යයි.

..................................................................................................................................

2. ඔහු පිරිසිදු ඇඳුම් අඳියි.

..................................................................................................................................

3. ඔහු අඹ පැළය සිටුවයි.

..................................................................................................................................

4. ඔහු අවවාද පිළිපදියි.

..................................................................................................................................

5. ඔහු පිරිසිදු ජලය පානය කරයි.

..................................................................................................................................

04) පළමු වාක්‍ය දෙස බලා ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා ලියන්න.
(ඔහු කතන්දරය ඇසුරෙන් ප්‍රශ්න ඇසුවේ ය./ඔහු තම කණ්ඩායම ජයග්‍රහණය කරා මෙහෙය වූවේ ය./ඔහු පරෙස්සමින් මගීන් රැගෙන ගියේ ය./ඔහු පොතක් කියවා අවසන් කළේ ය./ඔහු රෝගීන් පරීක්ෂා කළේ ය./ඔහු කෝපි කෝප්පයක් බිව්වේ ය.)

1. වෛද්‍යවරයා රෝහලට ගියේ ය.

..................................................................................................................................

2. රියදුරා බස් රථය පැදවූවේ ය.

..................................................................................................................................

3. සීයා උදේ ම අවදි වූවේ ය.

..................................................................................................................................

4. අයියා විවේකයෙන් කාලය ගත කළේ ය.

..................................................................................................................................

5. ක්‍රීඩා නායකයා සාධාරණ ව සිතුවේ ය.

..................................................................................................................................

6. ගුරුතුමා කතන්දරයක් පැවසුවේ ය.

..................................................................................................................................

05) පළමු වාක්‍ය තුන කියවා එම රටාව අවබෝධ කරගෙන දී ඇති හිස්තැනෙහි ඇ/ඇය පදය යොදා නිදහසේ වෙනත් වාක්‍ය ගොඩනඟා ලියන්න.

සමන්

1. සමන් මගේ යහළුවෙකි.
2. ඔහු සැමදින ම නොවරදවා පාසල් ගියේ ය.
3. ඔහු එය පුරුද්දක් කරගත්තේ ය.

සහන්

1. සහන් මගේ යහළුවෙකි.

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

සීයා

1. මගේ සීයා උගතෙකි.
2. ඔහු බොහෝ පොත්පත් කියෙව්වේ ය.
3. ඔහු රට, ලෝකය පිළිබඳ බොහෝ දේ පැවසුවේ ය.

සීයා

1. මගේ සීයා උගතෙකි.

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

මල්ලී

1. මගේ මල්ලී යහපත් ළමයෙකි.
2. ඔහු විනෝදාංශය ලෙස මුද්දර එකතු කළේ ය.
3. ඔහු විවේකය ඵලදායී ව ගත කළේ ය.

මල්ලී

1. මගේ මල්ලී යහපත් ළමයෙකි.

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

## 14)"ඌ" යෙදුණු අතීත කාල වාක්‍ය

01) දී ඇති ඡේදවල "ඌ" යන්න සමග යෙදී ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියන්න.

**ගිරවා**

අපේ නිවසේ අඹ ගසට සැම දිනක ම පැමිණි ගිරවා අලංකාර ය. ඌ ඉදුණු අඹ කෑවේ ය. අඹ අවාරයට ද ගිරවා අඹ ගසට පැමිණ සුළු මොහොතක් සිටියි. ඌ ජම්බු, රඹුටන් ආදි පලතුරු කෑවේය. විටෙක ඌ වී කරල් ද රැගෙන අඹ ගසට ආවේ ය. ටික දිනක් යන විට ගිරවා අඹ ගසේ ඇති බෙනයක තම නිවහන තැනීම ආරම්භ කළේ ය. ඌ ඒ සඳහා දවසේ බොහෝ වේලාවක් ගත කළේ ය. ටික දිනක් යන විට ඌ තම නිවහන තනා නිම කළේ ය.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

4. ..............................................................................................................................

5. ..............................................................................................................................

| හාවා |
| --- |
| අපේ ගෙදර මිදුලේ උඳුපියලිය වවා තිබුණි. දිනක් හාවෙක් උඳුපියලිය බිමට ආවේ ය. ඌ උඳුපියලිය කෑවේ ය. අනතුරු ව ඌ උඳුපියලිය බිමේ පිනුම් ගැසුවේ ය.<br>ඌ දිග කන් ඔසවා වටපිට බැලුවේ ය. හාවා නැවතත් උඳුපියලිය කෑවේ ය. නැවතත් ඌ වටපිට බැලුවේ ය. ඌ සැම විට ම අවට පිළිබඳ විමසිලිමත් වූවේ ය. |

1. ...............................................................................................................................

2. ...............................................................................................................................

3. ...............................................................................................................................

4. ...............................................................................................................................

5. ...............................................................................................................................

02) පහත සඳහන් වගුවේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

| |
| --- |
| ඌ පැන පැන යයි. ඌ ඉදුණු පලතුරු දෙස බැලුවේ ය. ඌ ගඟෙන් වතුර බොයි. ඌ ඉහළ අහසේ පියඹා ගියේ ය.<br>ඌ ගස්වල දලු කෑවේ ය. ඌ ගඟ දෙස බලයි. ඌ සතුටින් පැන පැන ගියේ ය.<br>ඌ කැලය දෙසට ඇදෙයි. ඌ ගම වටේ දිවුවේ ය. ඌ රඹුටන් ගසේ සිටියි. |

වර්තමාන කාල වාක්‍ය

1. ...............................................................................................................................
2. ...............................................................................................................................
3. ...............................................................................................................................
4. ...............................................................................................................................
5. ...............................................................................................................................

අතීත කාල වාක්‍ය

1. ...............................................................................................................................
2. ...............................................................................................................................

3. ..............................................................................................................................

4. ..............................................................................................................................

5. ..............................................................................................................................

03) පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

1. ඌ ඉදුණු පලතුරු කයි.

..............................................................................................................................

2. ඌ මවගෙන් කිරි බොයි.

..............................................................................................................................

3. ඌ වටපිටාව දෙස විමසිලිමත් වෙයි.

..............................................................................................................................

4. ඌ කැලයට පැන පැන යයි.

..............................................................................................................................

5. ඌ ගසේ අත්තක කූඩුවක් සාදයි.

..............................................................................................................................

04) පළමු වාක්‍ය දෙස බලා ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා ලියන්න.
(ඌ සිංහ ධේනුව සහ පැටියා සිටින අයුරු දුටුවේ ය./ඌ කැරට් අලය කෑමට පටන් ගත්තේ ය. /ඌ මලින් මලට ගොස් මල් පැණි බිව්වේ ය./ ඌ විමසිල්ලෙන් යුතු ව වටපිට බැලුවේ ය./ඌ වක්කඩ ළඟ සිටින තිත්ත පැටවුන් දුටුවේ ය.)

1. හාවා කැරට් අලය දෙස ආශාවෙන් බැලුවේ ය.

..............................................................................................................................

2. ඇතා කැලයේ ඔබමොබ සැරිසැරුවේ ය.

..............................................................................................................................

3. සිංහයා ගල් ගුහාවේ සිට එළියට ආවේ ය.

..............................................................................................................................

4. සමනලයා උදෑසන ම මල් වත්තට පැමිණියේ ය.

..............................................................................................................................

5. කොකා වෙල අද්දර සිටගෙන සිටියේ ය.

..............................................................................................................................

05) පළමු වාක්‍ය තුන කියවා එම රටාව අවබෝධ කරගෙන දී ඇති හිස්තැනෙහි ඇ/ඈය පදය යොදා නිදහසේ වෙනත් වාක්‍ය ගොඩනගා ලියන්න.

සමනලයා

1. සමනලයා ලස්සන සතෙකි.
2. ඌ උදෑසනින් ම මල් වත්තක් සොයා පියාඹුවේ ය.
3. ඌ මල් වත්තකට ගොස් මල් පැණි බිව්වේ ය.

මී මැස්සා

1. මී මැස්සා කඩිසර සතෙකි.

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

ඇතා

1. ඇතා විශාල සතෙකි.
2. ඌ කොළ අතු ආහාරයට ගත්තේ ය.
3. ඌ තම ශරීර ශක්තිය පෙන්වමින් විශාල කොටන් ඇද්දේ ය.

ජිරාෆ්

2. ........................................................................................................................................

3. ........................................................................................................................................

කොහා

1. කොහා අවුරුදු කාලයට දක්නට ලැබුණු පක්ෂියෙකි.
2. ඌ උදෑසනින් ම අවදි වූවේ ය.
3. ඌ මිහිරි හඬින් නාද කළේ ය.

ගිරවා

1. ගිරවා අලංකාර පක්ෂියෙකි.

2. ........................................................................................................................................

3. ........................................................................................................................................

## 15) "ඔවුහු" යෙදුණු අතීත කාල වාක්‍ය

01) දී ඇති ඡේදවල "ඔවුහු" යන්න සමඟ යෙදී ඇති අතීත කාල වාක්‍ය උපුටා ලියන්න.

සචිනි සහ සචිනි කවි ලියති. ඔවුහු ලියන කවි පුවත්පත්වල පළ කිරීමට ද යැවූහ. එම කවි ඉතා මනරම් ය. ඔවුහු හිමිදිරිය, රෑ අහස, යහළුවා යන සෑම මාතෘකාවක් පිළිබඳව ම කවි ලියති. ඔවුහු කවි තරගවලට ද සහභාගි වූවෝ ය. ඔවුහු ඒවායින් ජයග්‍රහණ ද ලබා ගත්හ.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................
4. ........................................................................................................................................

කවිඳු සහ සවිඳු අපතේ යන ද්‍රව්‍යවලින් අපූරු නිර්මාණ කරති. ඔවුහු එම නිර්මාණ එකතු කර ප්‍රදර්ශනයක් ද පැවැත්වූහ. ඔවුහු විවේකයෙන් සිටින විට බොහෝ අපූරු දේවල් නිර්මාණය කරති. දිනක් ඔවුහු එම නිර්මාණ අන්තර්ජාලයට ද එක් කළහ.

1. ........................................................................................................................................
2. ........................................................................................................................................
3. ........................................................................................................................................

සචිනි, සචිනි සහ සචිඳු හතර වන ශ්‍රේණියේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ය. ඔවුහු වටපිටාව පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරති. දිනක් ඔවුහු පාසල් යමින් සිටියහ. අතරමඟ දී ඔවුහු කොකුන් දෙදෙනෙකු සහ ඉබ්බෙකු දුටුවෝ ය. කොකුන් දෙදෙනා සහ ඉබ්බා පිළිබඳ ව අසා ඇති අපූරු කතන්දරය ඔවුහු සිහිපත් කළහ.

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

02) පහත සඳහන් වගුවේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

ඔවුහු ගමට ගියෝ ය. ඔවුහු කතා කරති. ඔවුහු ගීත ගයති. ඔවුහු නාට්‍යයක් රඟ දැක්වූහ. ඔවුහු කතන්දර ලියති. ඔවුහු ප්‍රදර්ශනය නැරඹූහ. ඔවුහු චිත්‍රපටයක් බලති. ඔවුහු සංදර්ශනයට සහභාගි වෙති. ඔවුහු චිත්‍ර ඇන්දෝය. ඔවුහු ක්‍රීඩා කළහ.

**වර්තමාන කාල වාක්‍ය**

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................
5. ..............................................................................................................................

**අතීත කාල වාක්‍ය**

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................
5. ..............................................................................................................................

03) පහත දී ඇති වර්තමාන කාල වාක්‍ය අතීත කාලයෙන් ලියන්න.

1. ඔවුහු අනුරාධපුරයට යති.

..............................................................................................................................

2. ඔවුහු සමබල ආහාර වේලක් ගනිති.

..............................................................................................................................

3. ඔවුහු සමඟියෙන් ජීවත් වෙති.

..............................................................................................................................

4. ඔවුහු කාරුණික ව කතා කරති.

..............................................................................................................................................

5. ඔවුහු දෙමව්පියන්ගේ අවවාද පිළිගනිති.

..............................................................................................................................................

04) පළමු වාක්‍ය දෙස බලා ඊට ගැළපෙන දෙවන වාක්‍ය වරහන් තුළින් තෝරා ලියන්න.
(ඔවුහු ගීත රස වින්දෝ ය./ඔවුහු නිරෝගී ව සිටියහ./ ඔවුහු පරෙස්සමෙන් පාසල් ගියහ./ ඔවුහු පන්ති කාමරය පිරිසිදු කළහ./ඔවුහු පොත් කියවූහ.)

1. මලිති සහ ගයනි පිරිසිදු ජලය පානය කළහ.

..............................................................................................................................................

2. මලිත්, ශනෙත් සහ පසන් ගුවන්විදුලියට සවන් දුන්හ.

..............................................................................................................................................

3. ප්‍රබෝධි, මලිත් සහ පසන් පුස්තකාලයට ගියහ.

..............................................................................................................................................

4. පසිඳු සහ සඳරු උදෑසනින් ම පාසල් ගියහ.

..............................................................................................................................................

5. නයනි, පවනි සහ ධනුක පාරේ දකුණු පසින් ගමන් කළහ.

..............................................................................................................................................

## 16) "මම" යෙදුණු අතීත කාල වාක්‍ය

01) පහත සඳහන් වගුවේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

| |
|---|
| මම ගීතයක් ගැයුවෙමි. |
| මම හොඳින් පාඩම් කරමි. |
| මම උදෑසන ම පාසල් ගියෙමි. |
| මම අඹ පැළයක් සිටුවමි. |
| මම සරුංගලයක් සෑදුවෙමි. |
| මම සැමදෙනාට කරුණාව දක්වමි. |
| මම දිවා ආහාරය ගත්තෙමි. |
| මම අසරණයන්ට පිහිට වෙමි. |
| මම අම්මාට උදවු කළෙමි. |
| මම පිරිසිදු ව අඳිමි. |

වර්තමාන කාල වාක්‍ය

1. ..............................................................................................................................

2. ..............................................................................................................................

3. ..............................................................................................................................

4. ..............................................................................................................................

5. ..............................................................................................................................

අතීත කාල වාක්‍ය

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................
5. ..............................................................................................................................

02) පහත සඳහන් ඡේදයේ ඇති "මම" ලෙසින් ආරම්භ වන වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

> **රෑ අහස**
>
> රෑ අහස චමත්කාර ය. සඳ සහ තරු මහ පොළොව දෙස සිනාසී බලන්නාක් මෙන් මට පෙනෙයි.
>
> මම රෑ අහසට බොහෝ ලෙස ඇලුම් කරමි. දිනක් මම රෑ අහස සිතුවමට නැඟුවෙමි. මම එය ලස්සනට වර්ණ ගැන්වූවෙමි. එය මම පාසල් චිත්‍ර තරගයට ද ඉදිරිපත් කළෙමි. මම එයින් ජය ගත්තෙමි. ඒ නිසා ම මම තවත් බොහෝ ලෙස රෑ අහසට ආදරය කරමි. රෑ අහස දෙස මම සැම දිනම බොහෝ වේලාවක් බලා සිටිමි. ඒ දෙස බලා සිටින විට මම කවි ලියමි. රෑ අහස පිළිබඳ කවි එකතුවක් ද මට තිබේ.

වර්තමාන කාල වාක්‍ය

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................

අතීත කාල වාක්‍ය

1. ..............................................................................................................................
2. ..............................................................................................................................
3. ..............................................................................................................................
4. ..............................................................................................................................

03) එක් එක් වාක්‍යයට ගැළපෙන අතීත කාල වාක්‍ය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.

(මම පොත් කියවා කරුණු සෙව්වෙමි./ මම දෙමව්පියන්ට සැලකුවෙමි./ මම වැඩිහිටියන්ට ගරු කළෙමි./මම සැප දුක සම සිතින් භාර ගත්තෙමි./ මම දිනපතා පුවත්පත් කියෙවුවෙමි. /මම නිවැරදි ව අකුරු ලිවුවෙමි.)

1. මම සැප දුක සම සිතින් භාර ගනිමි.

..............................................................................................................................

2. මම නිවැරදි ව අකුරු ලියමි.

..............................................................................................................................

3. මම පොත් කියවා කරුණු සොයමි.

..............................................................................................................................................

4. මම දිනපතා පුවත්පත් කියවමි.

..............................................................................................................................................

5. මම දෙමව්පියන්ට සලකමි.

..............................................................................................................................................

6. මම වැඩිහිටියන්ට ගරු කරමි.

..............................................................................................................................................

04) නිවැරදි අතීත කාල ක්‍රියා පදය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. මම සරුංගලය උඩ ................................ (යවමි./යැවූවෙමි)
2. මම සතුටින් ජීවත් ................................ (වූවෙමි./වෙමි.)
3. මම වැඩිහිටියන්ගේ අවවාද ................................ (පිළිපැද්දෙමි./පිළිපදිමි.)
4. මම ගුරුවරුන්ගේ සිත් ................................ (නොරිද්දුවෙමි./නොරිද්දමි.)
5. මම ශාරීරික ව්‍යායාම්වල ................................ (නිරත වෙමි./නිරත වූවෙමි.)
6. මම රටට සේවය ................................ (කරමි./කළෙමි.)

05) එක් එක් වාක්‍යවල අතීත කාල වාක්‍ය ලියන්න.

1. මම ගෙවත්තක් සකසමි.

..............................................................................................................................................

2. මම දෙගුරුන්ගේ අවවාද අසමි.

..............................................................................................................................................

3. මම මගේ රටට ආදරය කරමි.

..............................................................................................................................................

4. මම අසරණයන්ට පිහිට වෙමි.

..............................................................................................................................................

5. මම හොඳින් ඉගෙන ගනිමි.

..............................................................................................................................................

06) දී ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍යයක් නම් ඊට අදාළ තීරුවේ √ ලකුණ ද අතීත කාල වාක්‍යයක් නම් ඊට අදාළ තීරුවේ √ ලකුණ ද යොදන්න.

| වාක්‍යය | වර්තමාන කාලය | අතීත කාලය |
|---|---|---|
| * මම සැම දෙනාට ම කරුණාව දක්වමි. | | |
| * මම සතුටින් ජීවත් වූවෙමි. | | |
| * මම තරගයෙන් ජය ගත්තෙමි. | | |
| * මම උදෑසන ම පාසල් යමි. | | |
| * මම සමඟියෙන් සෙල්ලම් කරමි. | | |
| * මම උනන්දුවෙන් ඉගෙන ගත්තෙමි. | | |
| * මම දිනපතා ප්‍රවෘත්ති අසමි. | | |

| | | |
|---|---|---|
| * මම රට, ලෝකය පිළිබඳ දැන සිටියෙමි. | | |
| * මම සෞඛ්‍ය සම්පන්නව ජීවත් වෙමි. | | |
| * මම මගේ රටට ආදරය කරමි. | | |

## 17) "අපි" යෙදුණු අතීත කාල වාක්‍ය

01) පහත සඳහන් පැවරුම් පතේ ඇති වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

අපි සැම දෙනාට කරුණාව දැක්වූවෙමු.
අපි චිත්‍රයක් අඳිමු.
අපි ළමා නාට්‍යයක් නැරඹුවෙමු.
අපි තාලයට නටමු.
අපි කතන්දර පොත් කියෙවුවෙමු.
අපි නිවැරදි ව අකුරු ලියමු.
අපි විනෝද චාරිකාවක් ගියෙමු.
අපි පිට්ටනියේ සෙල්ලම් කරමු.
අපි දිවා ආහාරය ගත්තෙමු.
අපි සතුටින් සිටිමු.

**වර්තමාන කාල වාක්‍ය**

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................

**අතීත කාල වාක්‍ය**

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................
5. ..........................................................................................................

02) පහත සඳහන් ඡේදයේ ඇති "අපි" ලෙසින් ආරම්භ වන වාක්‍ය වර්තමාන කාල වාක්‍ය සහ අතීත කාල වාක්‍ය ලෙස වෙන් කර ලියන්න.

**ගොවිපළක් නැරඹුවෙමු.**

"අපි මෙවර ක්ෂේත්‍ර චාරිකාව සඳහා ගොවිපළක් නැරඹීමට යමු" යැයි ගුරුතුමිය යෝජනා කළා ය. ගොවිපළක් යනු විවිධ භෝග වගා කරන භූමියකි. අපි ගොවිපළක් නැරඹීමට ගියෙමු. ගොවිපළේ විවිධ වගාවන් නරඹමින් අපි බොහෝ දුර ගමන් කළෙමු.

"දැන් නම් හොඳට ම බඩගිනියි. අපි දවල් කෑම කමු" යැයි කවිඳු යෝජනා කළේ ය. කුඩා දොළ පාරක් අසල දී අපි දිවා ආහාරය ගත්තෙමු.

"ගොවිපළ නැරඹීමේ දී වගාවන්ට කිසි ම හානියක් නො කළ යුතු බව" ගුරුතුමිය පැවසුවා ය. ගොවිපළේ වගාවන් කොළ පැහැයෙන් දිස් වේ. මල් ජාති, ගෙඩි ජාති මෙන් ම පලා වර්ග ද කදිමට වැඩී තිබුණි.

"ගොවිපළේ අසිරිය ගැන අපි කවි ලියමු" කවීශා පැවසුවා ය. අපි පන්තියේ දී කවි ලියමු. අපි එහා පැත්තේ තිබෙන සත්ත්ව ගොවිපළටත් යමු" යැයි ගුරුතුමිය යෝජනා කළා ය.

සත්ත්ව ගොවිපළත් නරඹා අපි සවස් වන විට නිවෙස් බලා පිටත් වුණෙමු.

### වර්තමාන කාල වාක්‍ය

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................
5. ..............................................................................................

### අතීත කාල වාක්‍ය

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................

**03) එක් එක් වාක්‍යයට ගැළපෙන අතීත කාල වාක්‍ය වරහන් තුළින් තෝරා හිස්තැනෙහි ලියන්න.**

**((අපි සාකච්ඡාවකට සවන් දුන්නෙමු. / අපි ගීතයක් රස වින්දෙමු. / අපි කාලය අපතේ නොයැව්වෙමු. / අපි නිරෝගී ව සිටියෙමු. / අපි කෞතුකාගාරය නැරඹුවෙමු. / අපි ඉවසීමෙන් කටයුතු කළෙමු.)**

**1. අපි ඉවසීමෙන් කටයුතු කරමු.**

..............................................................................................

**2. අපි කෞතුකාගාරය නරඹමු.**

..............................................................................................

**3. අපි ගීතයක් රස විඳිමු.**

..............................................................................................

**4. අපි නිරෝගී ව සිටිමු.**

..............................................................................................

**5. අපි සාකච්ඡාවකට සවන් දෙමු.**

..............................................................................................

**6. අපි කාලය අපතේ නොයවමු.**

